අධිකරණ අමාත්‍යාංශය நீதி அமைச்சு MINISTRY OF JUSTICE

# ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය
# தேசிய ஒற்றுமை மற்றும் நல்லிணக்கத்திற்கான அலுவலகம்
# Office For National Unity And Reconciliation

ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය 2024 අංක 01 දරණ පණත මගින් පිහිටුවන ලද ආයතනයක් වන අතර උක්ත කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අභ්‍යන්තර විගණන නිලධාරි | තනතුරු සංඛ්‍යාව : **01** |
|---|---|

සේවා ගණය : **JM 1-1**

## තනතුරෙහි ස්වභාවය

- විගණන හා කළමනාකරණ කමිටුවේ අනුමැතියට යටත්ව අවදානම් මත පදනම් වූ අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම, ආයතනයේ ප්‍රධාන අවදානම් හඳුනාගෙන මූල්‍ය, මෙහෙයුම්, අනුකූලතා, තොරතුරු තාක්ෂණ හා කාර්යසාධන විගණන සිදු කර පාලන ක්‍රමවේද, අවදානම් කළමනාකරණය සහ ආයතනික පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය හා කාර්යක්ෂමතාව ඇගයීම.

- අභ්‍යන්තර පාලන ක්‍රමවේදවල ප්‍රමාණවත්භාවය හා කාර්යක්ෂමතාව ඇගයීම, අදාළ නීති, රෙගුලාසි, රජයේ ප්‍රතිපත්ති, භාණ්ඩාගාර නියෝග, මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ආයතනික ප්‍රතිපත්තිවලට අනුකූලතාව තහවුරු කිරීම සහ ආයතනික පාලනය හා අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් ස්වාධීන සහතික කිරීමේ සේවාව සැපයීම.

- සාක්ෂි මත පදනම් වූ වෛෂයික විගණන වාර්තා සකස් කිරීම, ප්‍රායෝගික නිර්දේශ ඉදිරිපත් කිරීම, විගණන නිගමන කලමනාකරණය සහ විගණන හා කළමනාකරණ කමිටුව වෙත වාර්තා කිරීම, එකඟ වූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කිරීම සහ එහි ප්‍රගතිය වාර්තා කිරීම.

- වංචා අවදානම්, අභ්‍යන්තර පාලන දුර්වලතා, මූල්‍ය හා පරිපාලන අක්‍රමිකතා සහ මෙහෙයුම් අකාර්යක්ෂමතා හඳුනාගෙන අවශ්‍ය අවස්ථාවලදී විශේෂ විමර්ශන පැවැත්වීම, සහ අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය හා වෛෂයිකභාවය ආරක්ෂා කරමින් අභ්‍යන්තර පාලන, ආයතනික පාලනය, අවදානම් කළමනාකරණය හා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණයට උපදේශන සේවා සැපයීම.

- විගණන කටයුතු සඳහා අවශ්‍ය ලේඛන, වැඩපත්‍රිකා හා සාක්ෂි නිවැරදිව හා රහස්‍යභාවය ආරක්ෂා කරමින් පවත්වාගෙන යාම, විගණකාධිපති සහ අනෙකුත් නියාමන ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම, ආයතනය තුළ යහපාලනය, විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම, සහ අභ්‍යන්තර විගණන කටයුතු අදාළ වෘත්තීය ප්‍රමිතීන්, නීති සහ ආයතනික ප්‍රතිපත්තිවලට අනුකූලව සිදු කිරීම.

## සුදුසුකම් (පහත 1 හෝ 2)

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණ / රාජ්‍ය පරිපාලනය /ව්‍යාපාර පරිපාලනය හෝ තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත්, වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම

## වයස් සීමාව

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

---

## වැටුප් පරිමාණය

**JM 1-1 – 2025 -** රු. **(72,650 - 10 x 1,360 - 18 x 2,040 - 122,970)**

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)